සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

පැරණි නිර්දේශය / பழைய பாடத்திட்டம் / Old Syllabus

**OLD**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

**23 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**
- එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100**යි.

- අංක **1** සිට **25** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ ඇතුළත් සංයෝගය තෝරන්න.

**1.** දේශපාලන විද්‍යාව විකාශනය වීමේ දී,
A - සම්භාව්‍ය ග්‍රීක දාර්ශනිකයෝ පුරෝගාමී දායකත්වයක් සිදු කළ හ.
B - එහි විෂයපථය සහ ප්‍රවේශ ප්‍රසාරණය විය.
C - එය සමාජීය විද්‍යාවක් බවට පත් වූයේ දහනව වන සියවසේ දෙවන භාගයෙන් පසුව ය.
D - එය සෑම විටම සමාජ පන්ති අතර ගැටුම් අවධාරණය කෙළේ ය.
E - එය රාජ්‍යය සහ ආණ්ඩුව පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් ඔබ්බට ගොස් ඇත.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**2.** දේශපාලන විද්‍යා න්‍යායට අනුව රාජ්‍යය
A - වෙනස් වූ ඓතිහාසික තත්ත්වයන්ට අනුව විවිධ ස්වරූප ගෙන ඇත.
B - මධ්‍යතන යුගයේ දී වැඩවසම් ස්වරූපයක් අත්පත් කර ගත්තේ ය.
C - වර්තමානයේ දී ජාතික-රාජ්‍යය යනුවෙන් හැඳින්වේ.
D - සෑම විටම සාම්‍ය සඳහා පමණක් කැප වී ඇත.
E - ස්වාධිපත්‍ය බලය රහිත වූ විට පැවතීමට නොහැකි සමාජ ආයතනයකි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**3.** නිර්බාධවාදී රාජ්‍යය
A - පුද්ගලිකවාදය අවධාරණය කරයි.
B - ආර්ථිකය පාලනය කරයි.
C - සමාජයේ නීතිය සහ සාමය සහතික කරයි.
D - පුද්ගලයන් විසින් ආර්ථික කටයුතු මෙහෙයවිය යුතු යැයි පිළිගනියි.
E - මනුෂ්‍ය නිදහස සඳහා අවශ්‍ය තත්වයන් නිර්මාණය කරයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**4.** ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක අත්‍යවශ්‍ය අංග ලක්ෂණවලට ඇතුළත් වන්නේ,
A - මහජන පරමාධිපත්‍යය
B - අයිතිවාසිකම්
C - නියෝජන ආණ්ඩුව
D - නිදහස් සහ සාධාරණ මැතිවරණ
E - ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

[දෙවැනි පිටුව බලන්න

5. කැබිනට් ආණ්ඩු ක්‍රමය තුළ

A - අග්‍රාමාත්‍යවරයා සහ කැබිනට් මණ්ඩලය විධායක බලය ක්‍රියාත්මක කරයි.

B - අග්‍රාමාත්‍යවරයාට පාර්ලිමේන්තුවේ බහුතර සහාය හිමි විය යුතු ය.

C - කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට වගකිව යුතු නැත.

D - විධායකය සහ ව්‍යවස්ථාදායකය සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යයි.

E - දේශපාලන විධායකයේ සාමාජිකයන් පත් කරන්නේ ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් අතුරිනි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

6. මිශ්‍ර විධායක ක්‍රමය තුළ

A - විධායක දෙකක් සමගාමීව ක්‍රියාත්මක වෙයි.

B - ජනාධිපතිවරයාට, අග්‍රාමාත්‍යවරයාට වඩා බලතල ඇත.

C - ජනාධිපතිවරයා සෘජුව ම මහජනතාව විසින් තෝරා පත්කර ගනු ලැබේ.

D - අග්‍රාමාත්‍යවරයා ජනාධිපතිවරයාට වගකිව යුතු නැත.

E - ව්‍යවස්ථාදායකය විසින් අග්‍රාමාත්‍යවරයා ඉවත් කරනු ලැබීම, ජනාධිපති ධුරයට බලපෑමක් ඇති නොකරයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

7. ආණ්ඩුවේ අභ්‍යන්තර කාර්යයන්ට අයත් වන්නේ,

A - රාජ්‍යයේ භෞමික සීමා ආරක්ෂා කිරීමයි.

B - නීතිය හා සාමය පවත්වාගෙන යාමයි.

C - සමාජ සුභසාධනය සැලසීමයි.

D - සමාජ ගැටුම් කළමනාකරණය කිරීමයි.

E - පරිසර සුරක්ෂිතතාව සහතික කිරීමයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

8. දේශපාලන සමාජානුයෝජනයේ මාධ්‍ය අතර පහත සඳහන් ඒවා ද වෙයි.

A - ජනමාධ්‍ය

B - අධ්‍යාපන ආයතන

C - පවුල

D - පූජනීය ස්ථාන

E - මිත්‍රත්ව සංවිධාන/සමිති

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

9. දේශපාලන ප්‍රචණ්ඩත්වය

A - සමහර දේශපාලන කණ්ඩායම්වල හැසිරීම් රටාවකි.

B - කැරලි කෝලාහල තුළින් ප්‍රකාශයට පත් වේ.

C - වර්ගවාදය තුළ දැකිය හැකි ය.

D - ත්‍රස්තවාදයේ ප්‍රධාන අවියයි.

E - සමාජ සාමය ප්‍රවර්ධනය කරයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

10. පුරවැසි නිදහස සුරක්ෂිත කිරීමට නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් ගනු පියවරවලට අයත් වන්නේ,

A - නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීමයි.

B - විධායක බලය කේන්ද්‍රගත කිරීමයි.

C - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මානව අයිතිවාසිකම් ඇතුළත් කිරීමයි.

D - මාධ්‍ය නිදහස සහතික කිරීමයි.

E - ආර්ථික සහ සමාජ සාධාරණත්වය ඇති කිරීමයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

11. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ **අයහපත්** ප්‍රතිඵලවලට අයත් වූයේ,

A - ආණ්ඩුවේ අකාර්යක්ෂමතාව ඇති වීමයි.

B - සමාජ සුභසාධන ප්‍රතිපත්තිවල මතුවීමයි.

C - ආණ්ඩුකාරවරයාගේ බලය වර්ධනය වීමයි.

D - ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍ර ප්‍රමුඛ වීමයි.

E - අමාත්‍යවරුන් අතර සාමූහික වගකීමක් නොතිබීමයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

[තුන්වැනි පිටුව බලන්න.

12. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අග්‍රාණ්ඩුකාරවරයාගේ බලතල අතර පැවතියේ
   A - පාර්ලිමේන්තුව සම්මත කළ පනත් කෙටුම්පත්වලට අනුමැතිය දීමයි.
   B - පාර්ලිමේන්තුව කැඳවීම, වාර අවසාන කිරීම සහ විසුරුවා හැරීමයි.
   C - අග්‍රාමාත්‍යවරයා ධුරයෙන් ඉවත් කිරීමයි.
   D - සෙනෙට් සභාවට මන්ත්‍රීවරුන් 15 දෙනකු පත් කිරීමයි.
   E - උත්සවකාරී අවස්ථාවලදී පාර්ලිමේන්තුවේ මූලාසනය දැරීමයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

13. රාජ්‍ය පරිපාලනය
   A - රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ ක්‍රියාකාරකම්වලින් සමන්විත වේ.
   B - සමාජ සුභසාධන ප්‍රතිපත්ති නිසා පුළුල් වූ විෂයපථයක් සහිත ය.
   C - නිලධරතන්ත්‍රය මගින් ක්‍රියාත්මක වේ.
   D - දේශපාලනීකරණය නොවී තිබෙන විට වඩාත් කාර්යක්ෂම වේ.
   E - ශාස්ත්‍රීය අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙස ආරම්භ වූයේ ඉන්දියාවෙහි ය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

14. ගැටුම් විපරිවර්තනය
   A - ගැටුම් නිරාකරණයේ ඌණතාවලට පිළියම් යෙදීමට අපේක්ෂා කරයි.
   B - ගැටුම්වල සන්දර්භය වෙනස් කිරීම යන අර්ථය සහිත ය.
   C - ගැටුම්වලට සම්බන්ධ පාර්ශ්ව අතර සම්බන්ධතා වෙනස් කිරීම යන අර්ථය ද සහිත ය.
   D - ගැටුම්වල සමාජ සහ දේශපාලන මූලාශ්‍රවලට වැඩි අවධානයක් යොමු කරයි.
   E - ගැටුමක් ඒකපාර්ශ්වික ජයග්‍රහණයකින් අවසන් වීමට පහසුකම් සලසයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

15. සමාජවාදී ආණ්ඩු ක්‍රමය
   A - තනි පක්ෂ ක්‍රමයක් ප්‍රවර්ධනය කෙළේ ය.
   B - කොමියුනිස්ට් සමාජයක් ස්ථාපිත කිරීම ඉලක්ක කර ගත්තේ ය.
   C - පුද්ගල නිදහස පිළිගත්තේ ය.
   D - මාක්ස්වාදය මගින් මඟ පෙන්වනු ලැබිණි.
   E - සමානාත්මතාවාදී සමාජයක් ප්‍රවර්ධනය කෙළේ ය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

16. සිවිල් සමාජ ව්‍යාපාර
   A - ආණ්ඩුව මෙහෙයවීම සඳහා දේශපාලන බලය ලබාගැනීමට අපේක්ෂා කරයි.
   B - නිශ්චිත අභිලාෂ මත ගොඩනැගුණු සීමිත න්‍යායපත්‍ර සහිත ය.
   C - සමාජ ක්‍රියාකාරීත්වය සඳහා පුරවැසියන්ට අවකාශ සපයයි.
   D - රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට යෙදවුම් සපයයි.
   E - නූතන ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අත්‍යවශ්‍ය ය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

17. ඒකීය ආණ්ඩුක්‍රම ආකෘතිය යටතේ
   A - ස්වාධිපත්‍යය මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී යයි.
   B - පළාත් පාලන ආයතනවලට ස්වායත්තතාවක් නොමැත.
   C - පවතින්නේ තනි නීති ක්‍රමයකි.
   D - ප්‍රාදේශීය අභිලාෂවලට වඩා වැඩි ප්‍රමුඛතාවක් ජාතික අභිලාෂවලට ලබා දේ.
   E - ස්වාධිපත්‍ය බලය ස්ථානගත වන්නේ මධ්‍යම ආණ්ඩුව තුළ පමණකි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

18. අන්තර්ජාතික දේශපාලනය තුළ ප්‍රධාන ක්‍රියාකාරකයන් වන්නේ,
   A - ජාතික-රාජ්‍යයන් ය.
   B - ආගමික නායකයන් ය.
   C - අන්තර්-රාජ්‍ය සංවිධානයන් ය.
   D - කීර්තිමත් පුද්ගලයන් ය.
   E - ජාත්‍යන්තර මූල්‍ය ආයතනයන් ය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

[හතරවැනි පිටුව බලන්න

19. රාජ්‍යයන් සාමාන්‍යයෙන් බල දේශපාලනයේ යෙදෙන්නේ
A - ජාතික ආරක්ෂාව සඳහා ය.
B - ජාතික ආර්ථික ප්‍රතිලාභ සඳහා ය.
C - පාලකයන්ගේ ආත්ම තෘප්තිය සඳහා ය.
D - ජාතික අභිමානය සඳහා ය.
E - මනුෂ්‍යයේ ජේද මත ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

20. බල සමතුලිතතා සංකල්පයට අනුව,
A - රාජ්‍යයන් යුද්ධයට එළඹෙන්නේ බල අසමතුලිතතාවක් පවතින විට ය.
B - ඇතැම් විට රාජ්‍යයන්ට තමන්ගේම තනි උත්සාහය මගින් බල තුලනය ඇති කරගත හැකි ය.
C - රාජ්‍යයන් අතර සහයෝගීතාව, බල තුලනය ඇති කිරීමට ආධාරකාරී වේ.
D - රාජ්‍යයන් අතර බල තුලනය නිසා යුද්ධය අනවශ්‍ය බවට පත්වේ.
E - රාජ්‍යයන් අතර බල තුලනය ලෝක සාමයට මාධ්‍යයකි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

21. ශ්‍රී ලංකාවේ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව
A - දිස්ත්‍රික් පදනම මත ඡන්දයෙන් තෝරා පත් කරගත් සාමාජිකයන් 196 දෙනෙකුගෙන් සමන්විත ය.
B - නීති ලෙස සම්මත කළ පනත් අහෝසි කිරීමේ බලය හිමි එකම ආයතනය ය.
C - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් හෝ විධිවිධානයන් අස්ථිරවන නීති පැනවීමේ බලයකට හිමිකම් නොකියයි.
D - රාජ්‍ය මූල්‍ය පාලනය කිරීම පිළිබඳ බලයකට හිමිකම් නොකියයි.
E - නව පාර්ලිමේන්තුවක් තෝරාපත් කරගැනීමට මැතිවරණය සඳහා දිනයක් ප්‍රකාශ කිරීමෙන් තොරව විසුරුවා හැරීම ජනාධිපතිවරයාට කළ නොහැකි ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

22. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය
A - පාර්ලිමේන්තු පනත් පිළිබඳ අධිකරණ විමර්ශන බලයට හිමිකම් කියයි.
B - පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලභාවය තීරණය කිරීමේ තනි අධිකරණ බලය ක්‍රියාත්මක කරයි.
C - හය දෙනෙකුට නොඅඩු සහ දස දෙනෙකුට නොවැඩි විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත ය.
D - මූලික අයිතිවාසිකම් නඩු විභාග කිරීමේ බලය සහිත ය.
E - රටේ උත්තරීතර සහ අවසාන අභියාචන අධිකරණය වේ.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

23. ජාත්‍යන්තර අවබෝධය සහ සාමය ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍යයන් විසින් යොදා ගනු ලබන මාධ්‍ය වන්නේ
A - සාමූහික ආරක්ෂිතතාවයි.
B - අවි තරඟයයි.
C - ජාත්‍යන්තර නීති ය.
D - නිරායුධකරණයයි.
E - ජාත්‍යන්තර සම්මුතීන් ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

24. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සිලය
A - එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් තෝරා පත්කර ගනු ලබන සාමාජික රටවල් 47කින් සමන්විත ය.
B - සෑම වසර හතරකට වරක් ම සාමාජික රටවල මානව අයිතිවාසිකම් තත්ත්වය පිළිබඳ විශ්ව වාරික විවරණ වාර්තාවක් (universal periodic review) සකසයි.
C - 2006 වසරේ දී පිහිටුවන ලදී.
D - සාමාන්‍යයෙන් වසරකට සැසිවාර තුනක් පවත්වයි.
E - නිව්යෝර්ක් නගරයේ එක්සත් ජාතීන්ගේ මූලස්ථානයෙහි සිය කාර්යාලය පවත්වාගෙන යයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

[පස්වැනි පිටුව බලන්න

25. බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලය

A - තම අධිකාර පත්‍රය පිළිගැනීමට කැමති ඕනෑම රටකට සාමාජිකත්වය විවෘත කොට ඇත.

B - සෑම වසර දෙකකට වරක් තම මහා සමුළුව පවත්වයි.

C - තම මහ ලේකම් කාර්යාලය ලන්ඩන් නගරයෙහි පවත්වාගෙන යයි.

D - සමහර රාජ්‍යයන්ට තම සාමාජිකත්වය නැවත ලබා ගැනීමට ඉඩ දී ඇත.

E - බ්‍රිතාන්‍ය රජු/රැජින තම නිල නායකයා/නායිකාව ලෙස සලකයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

- අංක **26** සිට **40** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් **නිවැරදි** වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

26. 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ

(1) ශ්‍රී ලංකාව තුළ ධනවාදී ආර්ථිකයකට පදනම දැමී ය.

(2) දිවයිනේ පරිපාලනය ඒකාබද්ධ කොට මධ්‍යගත කෙළේ ය.

(3) ස්වාධීන අධිකරණයක් ස්ථාපිත කෙළේ ය.

(4) නිදහස් ස්වභාෂා අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දුන්නේ ය.

(5) ව්‍යවස්ථාදායක සභාවක් ස්ථාපිත කෙළේ ය.

27. ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය

(1) සමාජ සුභසාධනය රාජ්‍ය ප්‍රතිපත්තීන්හි අරමුණක් ලෙස අවධාරණය කෙළේ ය.

(2) පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට දායක විය.

(3) වතු කම්කරුවන්ගේ වෘත්තීය සමිති අරගලවලට පුරෝගාමී විය.

(4) මතවාදී ගැටුම් නිසා පසුබෑමකට ලක් විය.

(5) සභාග ආණ්ඩු පිහිටුවීමේ දේශපාලනය නොසලකා හැරියේ ය.

28. 1911 සහ 1924 අතර යටත් විජිත ශ්‍රී ලංකාවේ සිදු වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණවලින්

(1) ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කෙරිණි.

(2) සභාවේ තුළ ක්‍රමය ප්‍රතිසංස්කරණය කෙරිණි.

(3) සීමිත ඡන්දබලය හඳුන්වා දෙනු ලැබිණි.

(4) ව්‍යවස්ථාදායක සභාව තුළ නිල නොලත් මන්ත්‍රීන් සංඛ්‍යාව වැඩි කෙරිණි.

(5) සීමිත පළාත්බද නියෝජනය සඳහා මාවත විවෘත කෙරිණි.

29. යටත් විජිත ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය

(1) නාගරික වෘත්තික ප්‍රභූන්ගේ නායකත්වය යටතේ ක්‍රියාකාරී විය.

(2) රටපුරා පැතිරුණු පුළුල් මහජන ව්‍යාපාරයක් විය.

(3) වාර්ගික දේශපාලනය නිසා දුර්වල විය.

(4) වගකීම් සහගත ආණ්ඩුක්‍රමයක් ලබා ගැනීම අරමුණු කර ගත්තේ ය.

(5) යටත් විජිත ආණ්ඩුවට සෘජුව ම අභියෝග නොකෙළේ ය.

30. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාදායකය

(1) ව්‍යවස්ථාදායක සහ විධායක යන බලතල දෙවර්ගයම සහිත විය.

(2) ඡන්දයෙන් තෝරාපත් කරගත්, නම් කරනු ලැබූ සහ නිල ලත් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

(3) රාජ්‍ය මන්ත්‍රණ සභාව ලෙස හැඳින්විණි.

(4) ආණ්ඩුවේ වාර්ෂික අයවැය ලේඛනය පිළිබඳ වගකීම අමාත්‍ය මණ්ඩලයට පවරා දී තිබිණි.

(5) අමාත්‍ය මණ්ඩලය ඉවත් කිරීමේ බලතල සහිත විය.

31. ජනාධිපති ආණ්ඩුක්‍රම මාදිලිය යටතේ

(1) විධායකය සහ ව්‍යවස්ථාදායකය එකවිට පවත්වන මැතිවරණ මගින් තෝරා පත්කර ගැනේ.

(2) ජනාධිපතිවරයාගේ නායකත්වය යටතේ ඇති විධායකය ව්‍යවස්ථාදායකයට වඩා බලවත් ය.

(3) විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර පැහැදිලි කාර්ය විභේදනයක් පවතියි.

(4) ජනාධිපතිවරයා රාජ්‍ය නායකයා ය.

(5) විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර සම්බන්ධතා සකස්කොට තිබෙන්නේ බලතල වෙන් කිරීමේ සිද්ධාන්තයට අනුකූලව ය.

[පස්වැනි පිටුව බලන්න

2. ඉන්දියානු සන්ධීය ක්‍රමය තුළ,
   (1) ඇතැම් ප්‍රාන්ත රාජ්‍යවලට අනෙක් ප්‍රාන්ත රාජ්‍යවලට වඩා බලතල ඇත.
   (2) පුරවැසිභාවය ජාතික මෙන්ම ප්‍රාන්ත රාජ්‍ය මට්ටමින් ද ලබාගත හැකි ය.
   (3) සාංගමික ඒකකවලට ඇත්තේ ප්‍රාන්ත රාජ්‍යවලට වඩා අඩු බලයකි.
   (4) මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු අතර ඇතිවන ආරවුල් විසඳීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතුව ඇත.
   (5) හදිසි නීති බලතල යොදවා ප්‍රාන්ත ආණ්ඩු විසුරුවා හැරීමේ බලය මධ්‍යම ආණ්ඩුවට තිබේ.

33. ප්‍රංශයේ 1958 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
   (1) ශක්තිමත් ජනාධිපති ක්‍රමයක් ගොඩනැගී ය.
   (2) ආරම්භයේදී ජනාධිපතිවරයා ජනතාව විසින් සෘජුව ම තෝරාගැනීමට විධිවිධාන සහිත වූයේ නැත.
   (3) ජනාධිපති සහ කැබිනට් යන ක්‍රම දෙකෙහි ම මූලධර්ම ඒකාබද්ධ කෙළේ ය.
   (4) බ්‍රිතාන්‍ය කැබිනට් ක්‍රමයට සමාන කැබිනට් මණ්ඩලයක් නිර්මාණය කෙළේ ය.
   (5) ශක්තිමත් විධායක ආණ්ඩුක්‍රමයක ආදර්ශයක් ලෙස සැලකේ.

34. දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානයේ (සාක්)
   (1) මහලේකම් කාර්යාලය පිහිටා තිබෙන්නේ බංගලාදේශයේ අගනුවර වන ඩකා නගරයේ ය.
   (2) ආරම්භය සිදු වූයේ 1985 වසරේදී ය.
   (3) රාජ්‍ය නායක සමුළුවේ න්‍යායපත්‍රයට ද්වි පාර්ශ්වික දේශපාලන ආරවුල් ඇතුළත් නොකෙරේ.
   (4) ක්‍රියාකාරීත්වය විවේචනයට ලක්වන්නේ කලාපය තුළ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීමට අසමත් වීම නිසා ය.
   (5) ප්‍රථම මහලේකම්වරයා ශ්‍රී ලාංකිකයෙකි.

35. ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන
   (1) ජාත්‍යන්තර දේශපාලනයේ ක්‍රියාධරයෝ වෙති.
   (2) මානව හිමිකම් සහ සංවර්ධනය පිළිබඳ ගැටළුවලට ප්‍රමුඛත්වය දෙති.
   (3) ඇතැම් විට ජාතික ආණ්ඩුවල විවේචනයට භාජන වෙති.
   (4) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ඇත.
   (5) ජාත්‍යන්තර ගැටුම් සාමකාමීව විසඳීම ප්‍රවර්ධනය කරති.

36. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙන ලද ජනාධිපති ආණ්ඩුක්‍රමය,
   (1) ඩිගෝල්වාදී ක්‍රමයක් ලෙස ද හැඳින්විණි.
   (2) අග්‍රාමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා බවට පත් කෙළේ ය.
   (3) 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් වෙනසකට භාජනය කෙරිණි.
   (4) හඳුන්වා දුන් අවස්ථාවේ දී විරුද්ධ පක්ෂවල විරෝධයට ලක් විය.
   (5) විධායක ජනාධිපති ක්‍රමයක් වශයෙන් ද හඳුන්වනු ලැබිණි.

37. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය
   (1) ප්‍රධාන පක්ෂ දෙකෙහි ආධිපත්‍යය ලක්ෂණ කොට ගෙන තිබී ඇත.
   (2) සුළු පක්ෂ ගණනාවකින් ද සමන්විත ය.
   (3) ජනවාර්ගික-ආගමික ආයාචනා සහිත පක්ෂ බිහි කර තිබේ.
   (4) සෑම විටම සභාග දේශපාලනය අස්ථාවරත්වයට පත් කොට ඇත.
   (5) පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළින් විකාශනය වී ඇත.

38. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඇති මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය
   (1) මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ ජීව ගුණය පිළිබිඹු කරයි.
   (2) පුරවැසියන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වලට පිළියම් සඳහා විධිවිධාන සපයයි.
   (3) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට වඩා ඉදිරියට වර්ධනය වූ එකකි.
   (4) ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය දුර්වල කොට ඇත.
   (5) තම ක්‍රියාවන් සම්බන්ධයෙන් වගවීමට ආණ්ඩුව යොමු කොට ඇත.

39. නීතියක අත්‍යවශ්‍ය ලක්ෂණවලට ඇතුළත් වන්නේ
   (1) අධිකාරී බලයයි.
   (2) සමාජයේ සාමාජිකයන්ගේ චර්යාව හැඩගැස්වීමේ හැකියාවයි.
   (3) වෙනස් කළ නොහැකි බවයි.
   (4) නිරවුල් සහ නිශ්චිත බවයි.
   (5) සමාජ අවශ්‍යතා පිළිබිඹු කිරීමයි.

[හත්වැනි පිටුව බල

40. රාජ්‍ය ප්‍රතිපත්ති
(1) ජනතාවගේ අවශ්‍යතාවලට සහ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්විය යුතු ය.
(2) පවත්නා නෛතික රාමුව තුළ සකස් විය යුතු ය.
(3) අධිකරණ පරීක්ෂාවට යටත් විය යුතු ය.
(4) පාලක පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනයෙන් වෙනස් නොවිය යුතු ය.
(5) විශේෂඥයින්ගේ උපදෙස්/මෙහෙයුම් අනුව වැඩි දියුණු කළ හැකි වේ.

- අංක **41** සිට **45** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් **එක්** ප්‍රකාශයක් පමණක් නිවැරදි ය. **වැරදි ප්‍රකාශ සංයෝජය** ඇතුළත් වරණය තෝරන්න.

41. නව රාජ්‍ය යනු,
A - යුරෝපයේ වැඩවසම් ක්‍රමය බිඳ වැටීමෙන් පසුව බිහි වූ ඒවා ය.
B - පළමු ලෝක යුද්ධයෙන් පසුව ජාතීන්ගේ සංගමයට බැඳුණු රාජ්‍යයන් ය.
C - බල කඳවුරුවලින් ස්වාධීන වූ රාජ්‍යයන් ය.
D - යටත් විජිතකරණයෙන් පසුව යුරෝපයෙන් පිටත බිහි වූ රාජ්‍යයන් ය.
E - නව ලිබරල් ගෝලීය ආර්ථිකයෙන් ප්‍රතිලාභ ලබන රාජ්‍යයන් ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

42. විද්‍යාත්මක සමාජවාදය
A - කොමියුනිස්ට්වාදයට විකල්පයක් විය.
B - සමාජ ප්‍රගතිය පන්ති අරගලය තුළින් ඇති වේ යැයි විශ්වාස කෙළේ ය.
C - සමාජවාදය සඳහා පාර්ලිමේන්තු මාවත සුදුසු යැයි කියා සිටියේ ය.
D - කම්කරු පන්තියට තම අරමුණු ඉටුකර ගැනීම සඳහා ධනේශ්වර රාජ්‍යය යොදා ගත හැකි යැයි විශ්වාස කෙළේ ය.
E - කොමියුනිස්ට් සමාජය තුළ ද රාජ්‍යය පවතිනු ඇතැයි යන මතය දැරීය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

43. ශ්‍රී ලංකාවේ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
A - ඒක මණ්ඩලීය ව්‍යවස්ථාදායකයක් සහිත පාර්ලිමේන්තුවක් ස්ථාපිත කෙළේ ය.
B - මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් සහිත විය.
C - සුළු ජනවාර්ගික අයිතිවාසිකම් නොසලකා හැරියේ ය.
D - වෙස්ට්මින්ස්ටර් මාදිලිය මත පදනම් වූ කැබිනට් ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කෙළේ ය.
E - රාජ්‍ය සේවය, දේශපාලන අධිකාරය යටතට පත් කෙළේ ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

44. ශ්‍රී ලංකාවේ 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
A - වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රම මාදිලියෙන් සම්පූර්ණයෙන් කැඩී වෙන් විය.
B - පාර්ලිමේන්තු පනත් පිළිබඳ අධිකරණ විමර්ශන බලය හඳුන්වා දුන්නේ ය.
C - මැතිවරණ ක්‍රමය සංශෝධනය කෙළේ ය.
D - පාර්ලිමේන්තුවේ පරමාධිපත්‍ය මූලධර්මය ශක්තිමත් කෙළේ ය.
E - ලෞකික/නිරාගමික රාජ්‍යය පිළිබඳ මූලධර්මය හඳුන්වා දුන්නේ ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

45. ශ්‍රී ලංකාවේ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
A - දිස්ත්‍රික්ක පදනම් කරගත් බලය විමධ්‍යගත කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කෙළේ ය.
B - අමෙරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය මත පදනම් විය.
C - කැබිනට් මණ්ඩලයේ ස්වාධීනත්වය ශක්තිමත් කෙළේ ය.
D - රාජ්‍ය සේවය අමාත්‍යවරුන්ගේ පාලනයෙන් ස්වාධීන කෙළේ ය.
E - පාර්ලිමේන්තුව සහ ජනාධිපතිවරයා සඳහා වෙන් වෙන් මැතිවරණ හඳුන්වා දුන්නේ ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

අංක **46** සිට **50** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙකක් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැලපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4), සහ (5) යන වරණවලින් කවර වරණයදැයි තෝරා උත්තර පත්‍රයෙහි උචිත ලෙස ලකුණු කරන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 46. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඔම්බුඩ්ස්මන්වරයාට පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට බලය පවරා තිබේ. | නිල ධුර කාලය තුළදී ඔම්බුඩ්ස්මන්වරයාගේ වැටුප් අඩු කිරීමට පාර්ලිමේන්තුවට බලය තිබේ. |
| 47. | 1978 ආරම්භක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, පාර්ලිමේන්තුව තුළ නියෝජනය ලබා ගැනීම සඳහා ලබා ගතයුතු ඡන්ද ප්‍රතිශතය 5% කි. | සමානුපාතික නියෝජන ක්‍රමය සාමාන්‍යයෙන් කුඩා පක්ෂවලට සහ සුළු ජනවාර්ගික පක්ෂවලට නියෝජනය ලබා ගැනීමේ වාසිය අත්කර දෙයි. |
| 48. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනයෙන් ස්වාධීන කොමිෂන් සභාවලට සාමාජිකයන් පත් කිරීමට ජනාධිපතිවරයාට තිබූ අභිමතානුසාරී බලය අඩු කෙරිණි. | 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාට සැම තුන් මසකට වරක් පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට සහභාගී වීමට විධිවිධාන සැලැස්විණි. |
| 49. | 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවේ දෙවන මණ්ඩලයක් පිහිටුවූයේ නැත. | ජනතාව විසින් තෝරා පත්කර නොගත්තා සාමාජිකයන්ගෙන් සමන්විත සභාවක් පාර්ලිමේන්තුවෙහි තිබිය යුතු නැතැයි පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සම්පාදකයෝ විශ්වාස කළ හ. |
| 50. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කථානායකවරයාට පාර්ලිමේන්තුව කැඳවීමට සහ වාර අවසාන කිරීමට බලය ඇත. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ ගණපූරණය වන්නේ මන්ත්‍රීන් 40 දෙනෙකි. |

* * *